**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

---

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදි කිරීම් වෙනුවෙන් දරන ලද රු. 1,526,667 ක් වූ වියදම්, පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 303,580 ක් වූ පරිගණක යන්ත්‍රවල වටිනාකම සහ රු. 81,315 කට මිලදී ගෙන තිබුණු කාර්යාල උපකරණවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කළ සේවකයෙකුගෙන් අයවිය යුතුව පවතින රු. 39,966 ක සේවක ණය මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 31,391 ක් අඩුවෙන් දැක්වුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට අයවිය යුතුව පවතින රු. 82,200 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සහ 2015 වර්ෂයේදී මැතිවරණ රාජකාරි වෙනුවෙන් ගෙවා තිබූ රු. 21,238 ක් මැතිවරණ කොමසාරිස් වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

ඉකුත් වර්ෂය තුළ ඉටුකර තිබූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු. 283,221 ක් සහ සභාවේ සේවයේ නොමැති නිලධාරීන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු රු. 53,888 ක් වූ සේවක ඇප ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------

යන්ත්‍රෝපකරණ කුලී ආදායම් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා රු. 1,260,719 ක් වූ යන්ත්‍රෝපකරණ කුලී ආදායම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | -------------------------- | ------------ | -------------------- |
| | | රු. | |
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ) විධිවිධාන පනත සහ 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | | රු. 25,000 ට වැඩි ගෙවීම් මත රු. 25 ක මුද්දර බදු අයකර ගතයුතු වුවත්, සභාවේ නිලධාරීන්ට වැටුප් ගෙවීමේදී මුද්දර බදු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------- | | |
| | i. රෙගුලාසි අංක 103(1)(ආ) සහ රෙගුලාසි අංක104(1) | 37,300 | සභාව සතු ලොරි බවුසරයක් 2017 අගෝස්තු 14 දින අනතුරකට පත්ව අලුත්වැඩියා කටයුතු සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | ii. රෙගුලාසි අංක 104(4) | 204,695 | සභාව සතු කැබ් රථයක් 2017 දෙසැම්බර් 15 දින අනතුරකට පත්ව අලුත්වැඩියා කර තිබුණද, පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන අටක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 676,811 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,017,676 විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 332,500 | 327,985 | 320,958 | 7,000 | 251,500 | 318,290 | 318,290 | - |
| ii කුලී | 2,876,600 | 3,353,360 | 3,233,935 | 123,425 | 2,776,600 | 2,113,057 | 2,122,847 | 64,810 |
| iii බලපත්‍ර ගාස්තු | 339,900 | 763,230 | 733,880 | 24,000 | 296,500 | 553,945 | 548,595 | 5,350 |
| iv වෙනත් ආදායම් | 4,652,200 | 2,639,815 | 3,163,325 | 593,335 | 3,134,600 | 2,853,677 | 1,736,832 | 1,116,845 |
| එකතුව | 8,201,200 | 7,084,390 | 7,452,098 | 747,760 | 6,459,200 | 5,838,969 | 4,726,564 | 1,187,005 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ බිල්කළ මුළු ආදායම රු. 7,084,390 ක් වූ අතර, වර්ෂය තුළදී හිඟ ආදායම් ඇතුළුව රු. 7,452,098 ක් රැස්කර තිබුණි. වර්ෂය අවසානයට රු.747,760 ක හිඟ ශේෂයක් පැවතුණි.

### 2.2.3 වරිපනම් හා බදු

---------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 2.2.4 බදු කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ රු. 113,300 ක හිඟ කඩ කාමර කුලියෙන් 2018 ජුනි 11 දින වන විට රු. 71,500 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ආ) අඛණ්ඩව මාසික කුලී මුදල් හිඟව පැවතියද, හිඟ කුලී අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 සැප්තැම්බර් 21 දිනැති ඉදිරි වසර 02 ක් සඳහා බල පැවැත්වෙන තක්සේරු වාර්තාව අනුව ලුණුගම්වෙහෙර නව නගර කඩ කාමරයක මාසික කුලිය රු. 2,000 ක් වුවත්, රු. 1,000 බැගින් කුලී අය කිරීම නිසා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 300,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(2) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ කටයුතු කරන වෘත්තිකයන්ගෙන් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 230,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉටු නොකළ කර්තව්‍යයන්

2017 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති ප්‍රාදේශීය සභාව මගින් ඉටුකිරීමට නියමිතව තිබූ සංවර්ධන ව්‍යාපෘති 50 අතුරින් සංවර්ධන ව්‍යාපෘති 10 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**වීථි පහන් නඩත්තුව**

සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් හඳුනා ගැනීම සඳහා වීථි පහන් සංගණනයක් සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී වීථි පහන් නඩත්තුව සඳහා රු. 209,255 ක මුදලක් වැය කර තිබුණද, 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව වීථි පහන් නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 07 ක පැවති පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කර ගැනීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාව සඳහා සංවර්ධන නිලධාරී තනතුරු 8 ක් අනුමත වී තිබුණද, වර්ෂ හතරකට අධික කාලයක සිට සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු පමණක් සේවයේ යෙදී තිබුණි. මෙම තත්ත්වය

හේතුවෙන් සභාවේ දෛනික කාර්යයන් ඉටු කිරීමේදී අපහසු තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුව තිබුණද, 2018 පෙබරවාරි 23 දින වන විටත් මෙම ගැටළුව සඳහා විසඳුම් ලබා දී නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් භාවිතයට ගනු ලබන ගොඩනැගිලි 09 ක, ප්‍රජාශාලා 24 ක, ඉඩම් 07 ක, සුසාන භූමි 21 ක සහ වාහන 08 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2018 මාර්තු 23 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණු රණසිංහපුර ඔසු උයනේ බාහිර පාර්ශවයක් විසින් අනවසර වගාවක් පවත්වාගෙන යන බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, එම පාර්ශවය විසින් ඉඩමට ඇතුළු විය නොහැකි ලෙස ඉඩම වටා පොල් අතු ආවරණයක් යොදා තිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන හා විවිධ පාර්ශවයන් විසින් සභාවට පවරා ඇති ඉඩම් හා ගොඩනැගිලි නිශ්චිතව හඳුනාගැනීමට හා එම වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, දීර්ඝ කාලයක සිට සිදු නොකර තිබුණු අතර, මේ සම්බන්ධයෙන් කඩිනම් හා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා සභාවේ අවධානය යොමු විය යුතුව ඇත.

**3.4.2 නිෂ්ක්‍රීය වත්කම්**

සභාව සතු මහේන්ද්‍රා කැබ් රථය 2014 වර්ෂයේ සිට හා කසළ කරත්ත 02 ක් වර්ෂයකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

**3.4.3 ස්ථාවර වත්කම් සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

2016 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් වීරවිල පොළ ඉඩම දියුණු කිරීම, පොළ භූමිය සකස් කොට සතිපොළ විවෘත කිරීම හා අනෙකුත් නිර්දේශ 2018 මාර්තු 23 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් පහක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 14,176,857 ක් වූ අතර, එම වටිනාකම සියයට 03 සිට සියයට 57 දක්වා අගය පරාසයක විය.

(ආ) වියදම් විෂයයන් 5 ක ඉතිරි කිරීම්වල එකතුව රු. 7,460,237 ක් වූ අතර, එම වටිනාකම සියයට 12 සිට සියයට 62 දක්වා අගය පරාසයක විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

අංක DMA/2009 (i) දරණ 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ කමිටු රැස්වීම් 2 ක් පමණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරුණු සහ අඩුවෙන් හා වැඩියෙන් දක්වා ඇති අවස්ථා පැවතීම.<br>ii. ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකරන ලද අවස්ථා පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු නොකිරීම.<br>ii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා නොගැනීම. |

| | |
|---|---|
| (ඈ) සේවක කළමනාකරණය | කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඈ) වත්කම් කළමනාකරණය | i. සභාවට පැවරී ඇති වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු නොකිරීම. |
| | ii. වාහන දෙකක් නිශ්කාර්යව පැවතීම. |
| | iii. වාහන 8 ක අයිතිය පවරා ගෙන නොතිබීම. |
| (ඉ) අයවැය පාලනය | i. ඇතැම් වැය විෂයයන් වල ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරිවී තිබීම. |
| | ii. අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| | iii. අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම. |